# Historical Background of *Katina Chiwara Pūjā*

කඨින චීවර පුජාවේ ඓතිහාසික පසුබිම.

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

බුදුදහම වූ කලී සත්‍යය පසක් කරගත් ඒ ඔස්සේ මුළු මහත් ශ්‍රාවක ප්‍රජාවම මෙහෙය වන්නා වූ ඉතා වටිනා දර්ශනයකි. තව ද ලෝභ, ද්වේෂ, මෝහ, ආදි අකුසල මූලයන්ගෙන් සිත් කිළිටි කරගත් පෘථග්ජනයන් තව දුරටත් එහිම ගිලී යා නොදී නිවැරදි මාවත පෙන්වා දෙමින් ඒ ඔස්සේ ගමන් කිරීමට දිරිදෙන්නා වූ සකළ ලෝක සත්වයා කෙරෙහි ම පතලා වූ කාරුණිකත්වයෙන් සංසාර ගමනේ නිමාව පෙන්වා දුන් දහමකි. ප්‍රථම රහත් හැට නම අමතා "චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය ලෝකානුකම්පාය...."[1] යනුවෙන් වදාළේ නිවැරදි මාවත සැමට විවෘත කළයුතු බැවිනි. එයට අවනත වූ එම භික්ෂූන් නිරතුරුවම අව්වැසි ආදිය නොතකා ලෝ වැස්සන්ගේ යහපත උදෙසා සඳහම් චාරිකාවේ යෙදී ඇත. පොදු ජනයා මංමුලාවී සිටි යුගයක සත්‍යය පහදා දීම අත්‍යාවශ්‍යය විය. මේ නිසා භික්ෂු ශාසනය ආරම්භ වීමත් සමගම භික්ෂූන් වහන්සේලා ධර්ම චාරිකාවේ යෙදීම තත්කාලීන සමාජ අවශ්‍යතාව සපුරාලන්නක් විය.

මේ අන්දමින් භික්ෂු සමාජය දිනෙන් දින ව්‍යාප්ත වී ගිය අතර සත්‍යය පසක් කරගත් ගිහි අනුගාමිකයෝ විශාල පිරිසක් වූහ. එසේ වූ නමුදු මෙම යහපත් සමාජ වාතාවරණය කලකදී වෙනස් වී ගිය අයුරු වැසි කාලයේදී සඳහම් චාරිකාවේ යෙදෙන භික්ෂූන්ට චෝදනා කිරීමෙන් පෙනීයයි.[2] වැසි කාලයේ පක්ෂීහු පවා එක් තැනෙකට වී වාසය කරති. එහෙත් ශාක්‍ය පුත්‍ර භික්ෂූහු හැදීගෙන එන තණකොළ ආදිය පාගමින් වැසිකාලයේ දී පවා චාරිකාවේ යෙදෙන්නේ යැයි පවසමින් මිනිසුන් චෝදනාකර ඇත. මෙසේ චෝදනා එල්ලවීම නිසා ඒ පිළිබඳ සලකා බලා භික්ෂූන් වහන්සේලාට වස් විසීමට අනුදැන වදාළ බව "අනුජානාමි භික්ඛවෙ වස්සං උපගන්තුං"[3] යනුවෙන් දක්වා තිබීමෙන් පෙනීයයි. මෙම චෝදනා එල්ල කිරීම පිළිබඳ විමසා බැලීම වටී. ඒ කුමක් හෙයින්ද යත් බුදුන්වහන්සේ ශික්ෂාපද පැනවූයේ බුද්ධත්වයෙන් විසි වසක් ගෙවීගිය පසු වන බැවිනි.

ඉහත දැක්වූ පරිදි එම ශික්ෂා පද පනවන තෙක් භික්ෂූහු වර්ෂයේ සියලුම කාලයෙහි අව්වැසි නොතකා චාරිකාවේ යෙදී ඇත. එසේ නමුදු චෝදනා එල්ල වූයේ කලක් ගත වූ පසුවයි. මුලින් මහජනයා නිවැරදි යැයි පිළිගත් ඇතැම් දේ පසුව වැරදි යැයි පිළිගැනීම මඳක් මතභේදයට තුඩු දෙන්නකි. ඇතැම් විටෙක මෙම චෝදනාවන් තම බල අධිකාරිය බිඳ වැටෙනු දුටු බ්‍රාහ්මණ ආදීන්ගේ චෝදනාවක් ද විය හැකිය. එය එසේ නොවන්නේ නම් ප්‍රථමාභිසම්බෝධි යුගයේ දී සම්බුද්ධ ශාසනයේ පැවිදි වූවන් අල්ප වූ රජස් ඇති පුද්ගලයන් වූ නමුදු ප්‍රථමාභිසම්බෝධියෙන් පසු යුගයේදී කෙළෙස් බහුල පුද්ගලයන් ශාසනයේ මහණ වීම තුළ ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය පෙර පරිදි මහජනයාගේ ප්‍රසාදය ලබා ගැනීමට නොහැකි වූවාද විය හැකිය.

කෙසේ වු නමුදු මහජනයාගෙන් එල්ල වු චෝදනා පදනම් කොට ගෙන භාග්‍යවතුන් වහන්සේ වස් ශික්ෂාපදය පැනවීමෙන් පසුව වස් වසන්නේ කවර දිනයකදී ද යන ප්‍රශ්නය මතුවිය. " මහණෙනි වස්සාන ඍතුවේ වස් විසීමට නියම කරමි."[4] යනුවෙන් කුමන කාලයක දී වස් විසිය යුතුදැයි දක්වා ඇත. මෙය භික්ෂූන්ට එතෙක් හුරුපුරුදු දිවියට මදක් වෙනස් වුවක් බැවින් ඒ පිළිබඳ විවිධ ගැටළු මතුවී ආ අතර එයට විසඳුම් ලෙස ශික්ෂා පදයන් පනවා ඇත. වස් විසිය යුත්තේ වැසි සමයේ බව දැක්වීමෙන් අනතුරුව වස් විසීම් කෙතෙක් ඇත්දැයි යන ගැටළුව පැනනැගී ඇත. ඒ අනුව වස් එළඹිය යුතු දින දෙකක් ඇති බව "මහණෙනි, වස් විසීම් දෙකකි. පෙරවස පසුවස වශයෙනි. ඇසළ පුර පොහොය දිනයට පසු දින එනම්, ඇසළ අවපෑළවිය දා පෙරවස් විසිය යුතුය. ඇසළ පුර පොහොයෙන් මාසයක් ගිය පසු එනම්, නිකිණි අවපෑළවිය දා පසු වස් විසිය යුතුය. මහණෙනි, මේ වස් විසිය යුතු දින දෙකයි.[5] යනුවෙන් දක්වා ඇත.

පොදු සමාජය දෙස බැලු විට විවිධ අදහස් මතවාද දරණ සුවිශාල පිරිසකගෙන් එය සුසැදි ඇතිවාක් මෙන්ම මෙකල සංඝ සමාජය තුළ ද විවිධ මතවාද දරමින් ගැටළුකාරි තත්වයන් ඇති කළ භික්ෂු පිරිස් සිටි බව ඡබ්බග්ගිය ආදි භික්ෂූන් පිළිබඳ විමසීමේ දී පෙනීයයි. මොවුන් වස් කාලය තුළ වස් වසා චාරිකාවේ හැසිර ඇත. මේ පිළිබඳ මිනිසුන් පෙර මෙන් දොස් කියන්නට විය. මෙයට පිළියමක් වශයෙන් "මහණෙනි, වස් වැස පළමු තුන් මස හෝ පසු තුන් මස හෝ නොසිට චාරිකාවේ නොයා යුතුය. යමෙක් යන්නේ නම් දුක්කටාපත්ති වේ."[6] යනුවෙන් ශික්ෂාවන් පනවා ඇත. මේ පැනවීම් නිසා තමන්ගේ ගමන් වලට බාධා පැමිණි හෙයින් ඡබ්බග්ගිය භික්ෂූහු වස් විසිමට නොකැමැති වුහ. යම් භික්ෂු පිරිසක් මෙලෙස වස් වීසීමෙන් බැහැර වන්නට උත්සහ දරයි ද එබඳු තත්වයන් නිරාකරණය කරලීම උදෙසා මහණෙනි වස් නොඑළඹිය යුතු නොවේ. යමෙක් වස් නොඑළඹෙන්නෙ නම් දුකුළා ඇවැක් වේ.[7] යනාදි වශයෙන් ශික්ෂාවන් පනවා ඇත. මෙම පැනවීම සිදු කළ ද එයට ද අනුකුල නොවී ඊට විකල්ප ලෙස ඔවුන් එය මග හැරිමට විවිධ උපක්‍රම සොයන්නට විය. ඒ අනුව වස් වීසිමට නියමිත දිනය පැමිණි කල විහාරස්ථානයෙන් පිට වී ගිය බැවින් නැවත වරක් එම භික්ෂූන් වස් වීසිමට යොමු කිරිම සඳහා තවත් ශික්ෂාපද පනවන්නට සිදු වී ඇත. ඒ අනුව මහණෙනි, එදවස වස් එළඹෙන දිනයෙහි වස් නොඑළඹෙනු කැමැත්තහු විසින් දැන දැන ආවාසය නොඉක්මවිය යුතුය. යමෙක් ඉක්මවන්නේ නම් දුකුළා ඇවත් වේ.[8] යනුවෙන් දක්වා ඇත. මෙම පැනවීමෙන් පසුව වස් දිනය මඟහැර යාමට කිසිදු භික්ෂුවකට නොහැකි තත්වයකට පත්කර ඇත.

වස්සාන ඍතුව ළගා වුව ද රාජ නියෝගයක් වේ නම් වස් කාලය කල් දැමිය යුතුය. බිම්බිසාර රජුට යම් හේතුවක් නිසා වස් වසන දිනය ඉදිරියට ගන්නට අවශ්‍ය විය. මේ බව දන්වා රජු භික්ෂූන් වෙත දූතයෙකු යැවූ පසු බුදුරජාණන් වහන්සේ එයට ප්‍රතිචාර දක්වමින් රජවරුන්ට අනුකුල විය යුතු බව දක්වා ඇත.[9] රටක මූලික පාලන තන්ත්‍රයට අනුව යමින් තම ප්‍රතිපත්ති රැකිය යුතු බව මෙමගින් ප්‍රකාශ වේ. ඒ අනුව වස් වසන දිනය වර්ෂා ඍතුව ළගා වු කල්හි ඉටුකළ යුතු රැකිය යුතු චාරිත්‍ර ධර්මයක් වු අතර එය වෙනස් කිරීමේ හැකියාව රාජ්‍යයකට පමණක් හිමි ව තිබේ. මුල්කාලීනව වස් විසීමේ චාරිත්‍රය ඇරඹුණායින් පසුව ඇතැම් භික්ෂූන් සංචාරක ජීවිත ගත කළ බැවින් එය නොකළ

යුත්තක් සේ දක්වමින් වස්කාලය තුළ ආරාමයෙන් පිටතට වැඩීම ඇවැත්වීමට හේතුවක් වන බව වදාළහ. එබැවින් භික්ෂූන් වස් කාලය තුළ බැහැර වැඩීමකින් තොරව එහිම කල් ගෙවූහ.

සමකාලීනව උද්ගත වූ ඇතැම් ගැටළු පසුබිම් කරගනිමින් මෙම නියමයන් මඳක් ලිහිල් කළ බවත් වස්සූපනායිකඛන්ධකය විමසීමෙන් පෙනේ. ඊට අනුව කොසොල් ජනපදයෙහි විසූ භක්තිමත් දායකයෙකු වූ උදේන උපාසකතුමා සංඝයා වෙනුවෙන් නිරතුරුවම අවශ්‍ය කටයුතු සම්පාදනය කළ සංඝෝපස්ථායකයෙකි. ඔහු සංඝයා උදෙසා විහාරයක් කරවා දන් දීමට, බණ ඇසීමට, භික්ෂූන් දැකීමට කැමති බව දන්වා භික්ෂූන් වෙතට දූතයෙකු යැවූ බව සඳහන් වේ.[10] එනමුත් ඒ කාලය වැසි කාලයක් වූ බැවින් භික්ෂූන් වස් සමාදන්ව සිටි හෙයින් චාරිකාවේ හැසිරීමට අවසරයක් නොවූ බැවින් උදේන උපාසකතුමාගේ ඉල්ලීම භික්ෂූන් ප්‍රතික්ෂේප කළ බව පෙනේ.[11] වස් විසීමේ චාරිත්‍රය පිළිබඳව වැඩි තොරතුරක් නොදත් උදේන උපාසකතුමා තමන් භික්ෂූන්ට කෙතරම් සමීපව සියලු කටයුතු සපුරාලමින් කටයුතු කළ ද තමාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම නිසා නොසතුටු විය. ඒ පිළිබඳ භික්ෂූන්ට දොස් පවරා ඇත. භාග්‍යවතුන් වහන්සේට මේ පිළිබඳව සැලකිමෙන් පසු ඒ පිළිබඳ විමසා බලා එසේ පණිවිඩ එවූ කල්හි සත් දෙනෙකු වෙත සත්තාහකරණයෙන් යාමට අවසර ලබා දී ඇත. භික්ෂුව, භික්ෂුණිය, සික්ඛමානාවක්, සාමණේර, සාමණේරී, උපාසක, උපාසිකා යන මේ සත්දෙනා වෙත එසේ සත්තාහකරණයෙන් යා හැකි බවත් සතියක් ඇතුළත ආපසු පැමිණිය යුතු බවත් පෙන්වා දී ඇත.[12] ඒ අනුව උපාසකයෙකු විසින් සංඝයා උදෙසා විහාරයක් කරවා පින්වතුන් වහන්සේලා වඩින සේක්වා. මා දන් දෙන්නට ද, බණ අසන්නට ද, භික්ෂූන් දකින්නට ද කැමැත්තෙමියි, භික්ෂූන් වෙතට දූතයෙකු යවන්නේ නම් පණිවිඩ එවූ කල්හී සත්තාහකරණයෙන් යායුතු බවත් පණිවිඩ නොඑවූ කල්හි නොයා යුතු බවත් සතියකින් ආපසු පැමිණිය යුතු බවත් භාග්‍යවතුන් වහන්සේ වදාරා ඇති බව පෙනේ.[13]

යම් උපාසකයෙකු සංඝයා උදෙසා බොහෝ භික්ෂූන් උදෙසා එක් භික්ෂුවක් උදෙසා භික්ෂුණී සංඝයා උදෙසා බොහෝ භික්ෂුණීන් උදෙසා එක් භික්ෂුණියක් උදෙසා බොහෝ සික්ඛමානාවන් උදෙසා එක් සික්ඛමානාවක් උදෙසා, බොහෝ සාමණේරයන් උදෙසා, එක් සාමණේරයෙකු උදෙසා බොහෝ සාමණේරීන් උදෙසා එක් සාමණේරියක උදෙසා යන මේ කුමන අයෙකු හෝ පිරිසක් උදෙසා විහාරයක්, අඩ්ඪයෝගයක් හෙවත් ගුරුළු පියාපත් වැනි සෙවිලි ඇති ගෙයක්, ප්‍රාසාදයක් හෙවත් සිව්රැස් ගෙයක්, හම්මියක් හෙවත් සඳළු සහිත ගෙයක්, ගුහාවක්, පිරිවෙනක්, කොටුගෙයක්, උපස්ථාන ශාලාවක්, අග්නි ශාලාවක්, කප්පිය කුටියක්, වච්ච කුටියක්, සක්මන් මළුවක්, සක්මන් ශාලාවක්, ළිඳක්, ළිං හලක්, ජන්තාඝරයක්, ජන්තාඝර ශාලාවක්, පොකුණක්, මණ්ඩපයක්, ආරාමයක් හෝ ආරාම වත්තක් කරවා භික්ෂූන් වහන්සේලාට දන් දෙන්නට ද, බණ අසන්නට ද, භික්ෂූන් දකින්නට ද, කැමති යැයි භික්ෂූන් වෙතට පණිවිඩයක් එවූ කල්හි සත්තාහකරණයෙන් යායුතු බවත් පණිවිඩ නොඑවූ කල්හි නොයා යුතු බවත් බුදුරදුන් නියම කර ඇති බව පෙනේ.[14]

මීට අමතරව සත්තාහකරණයෙන් යා හැකි අවස්ථාවන් පිළිබඳව වස්සූපනායික ඛන්ධකයෙහි සඳහන් වේ. එහි සඳහන් වන ආකාරයට එක්තරා ගිලන් වූ භික්ෂුවක් තමා අසනීපයෙන් සිටින බැවින් භික්ෂූන්ට වඩින ලෙස දන්වා යැවූ බවත් ඒ බව බුදුරදුන්ට සැළ කල විට ඊට අවසර දී ඇත. ඒ අනුව

ගිලන් වූ විටක භික්ෂුවක, භික්ෂුණියක, සික්ඛාමානාවක, සාමණේරයකු, සාමණේරියක, යන පස්දෙනාගේ සමීපයට පණිවිඩ නොඑවූ කල්හි ද සත්තාහකරණයෙන් යාමට අවසර දී ඇත. එසේම සතියකින් නැවත පැමිණිය යුතු බව ද සඳහන් වේ.[15] අසනීප භික්ෂුවට ගිලන් බත් දීමට හෝ අසනීප වූ භික්ෂුවට උවටැන් කරන අයට ආහාර පාන දීමට හෝ, අසනීප වූ භික්ෂුවට බෙහෙත් ආදිය ලබාදීමට හෝ අසනීප භික්ෂුවගේ සුව දුක් විමසා බැලීමට හෝ උපස්ථාන කිරීමට යනාදි කුමන හෝ කාරණයක් උදෙසා ඉහත දක්වූ අයුරින් පණිවිඩයක් එවූ කල්හි පමණක් නොව නොඑවූ කල්හි ද යායුතු බව සඳහන් වේ.[16]

එමෙන්ම යම් භික්ෂුවක් සසුනෙහි කළකිරී සිටින්නේ නම් එම භික්ෂුව වෙත පණිවිඩ එවුවත් නොඑවුවත් යායුතු බවත් එසේ ගොස් දැහැමි කථාවෙන් කථා කොට ඔහුගේ කළකිරීම දුරු කළ යුතු බවත් තමාට එය කළ නොහැකි නම් වෙන කෙනෙකු ලවා හෝ කරුණු කියා එම භික්ෂුවගේ කල කිරීම දුරු කළයුතු බව සඳහන් වේ.[17] තව ද යම් භික්ෂුවකට කුකුසක් උපන්විට ද, යම් භික්ෂුවකට මිච්ඡාදිට්ඨියක් උපන් විටක දී ද ඒ අයුරින්ම යා යුතු බව සඳහන් වේ.[18] මෙය භික්ෂුවක් සඳහා පමණක් නොව භික්ෂුණියක්, සික්ඛමානාවක්, සාමණේරයෙක්, සාමණේරියක්, කෙරෙහි ද ඒ අයුරින් ම කටයුතු කළයුතු බව දක්වයි.[19] භික්ෂුවක් තමන් ගරු ඇවැතකට පැමිණියේ පරිවාසයක් ගැනිමට සුදුසු වුයේ වේද, භික්ෂුවක් මුලායපටිකස්සන නම් විනය කර්මය සුදුසු වුයේ වේද, භික්ෂුවක් මානතකට සුදුසු වුයේ වේද, භික්ෂුවක් අබ්භානයකට සුදුසු වුයේ වේද, සංඝයා භික්ෂුවකට තජ්ජනීය කර්මය, නිස්සය කර්මය, පබ්බාජනීය කර්මය, පටිසාරාණීය කර්මය හෝ උක්ඛෙපනීය කර්මය කරනු කැමැත්තක් වේ ද ඒ සඳහා ආරාධනා ලැබුණ ද නොලැබුණ ද සත්තාහකරණයෙන් යායුතු බව දන්වා ඇත.[20]

මීට අමතරව මව ගිලන් වූ කල්හි ද, ගිලන් බත් දීමට ද උපස්ථාන කරන අයට ආහාර පාන සපයාදීමට හෝ සුවදුක් විමසීමට පණිවිඩයක් එව්වත් නැතත් යා යුතු බවත්, පියා කෙරෙහි ද එසේම පිළිපැදිය යුතු බවත් සඳහන් වේ.[21] එසේ වුවත් තම සහෝදරයකු සහෝදරියක නෑදෑයෙකු මෙහෙකරුවකු අසනීප වූ කල්හි යා හැක්කේ පණිවිඩයක් එවූ කල්හි පමණි. පණිවිඩයක් නොඑවූ කල්හි නොයායුතු බවත් යන්නේ නම් සතියකින් නැවත පැමිණිය යුතු බව ත් දක්වයි.[22] තවද සංඝයාගේ කටයුතු සඳහා සත්තාහකරණයෙන් යාමට අවසර ලබා දී ඇත. සත් දිනක් ඉක්ම යාමට ප්‍රථම ව පැමිණිය යුතු බව ද එහි සඳහන් ය.[23] මේ අයුරින් විමසා බැලිමේ දී පෙනීයන වැදගත්ම කරුණක් වන්නේ වරක් පනවන ලද ශික්ෂා පදයන් සමකාලීනව උද්ගත වූ කරුණු කාරණා පදනම් කරගෙන අනුශික්ෂා පදයන් පනවමින් මදක් ලිහිල් කර දී ඇති බවයි. ඒ අනුව සත්තාහකරණයෙන් යායුතු අවස්ථා දක්වමින් ඊට අනුකූලව යාම වස් ශික්ෂාවක් රැකිමට බාධාවක් නොවන බව දන්වා ඇත.

වස් ශික්ෂාපදය ඇරඹුණායින් පසුව තමන්ට සුදුසු ස්ථානයන්හි වස් විසීමට භික්ෂූන් පෙළඹුණාහ. වස් වසන අවස්ථාවේ සුදුසු යැයි හැගෙන ඇතැම් ස්ථානයන් පසු කලෙක උවදුරු සහිත තැන් බවට පත්ව ඇත. එබඳු අවස්ථා කල්තියා හඳුනාගත නොහැකිවන අතර උවදුරු ඇති වූ විට එම ස්ථානයන්ගෙන් ඉවත්ව යාමට අවසර ලබා දී ඇත. ඒ සඳහා සමකාලීනව සිදු වූ යම් යම්

හේතු කාරණා බලපෑ බව වස්සුපනායිකඛන්ධකය විමසීමෙන් පෙනේ. එයට අනුව වරක් කොසොල් ජනපදයෙහි එක්තරා ආවාසයක වස් විසූ භික්ෂූහු චණ්ඩ සිව්පාවුන් විසින් පීඩා කරනු ලැබූහ. සමහරු බිම පෙරළා දැමූහ. භාග්‍යවතුන් වහන්සේට මේ බව සැලකළ විට "මහණෙනි, මෙහි වස් එළඹී භික්ෂූහු චණ්ඩ වන මෘගයන් විසින් පෙළන ලද්දාහු වෙත්, අල්වා ද ගනිත්. මරා ද හෙළත්. මේ මහත් අන්තරාය බැහැර යා යුතුයි. වස් සිදීමෙන් ඇවැත් නොවේ"[24] යැයි දක්වා ඇත. එසේම සර්පයන්ගේන් පීඩා පැමිණි විට ද, සොරුන්ගෙන් පීඩා විපත් පැමිණි විට ද, පිසාචයන්ගෙන් වන උවදුරු මගහැරිමට ද, ගොදුරු ගම ගින්නෙන් විනාශ වු කල්හි ද, වස් විසූ සෙනසුන ගින්නෙන් විනාශ වු කල්හි ද, ගම ජලයෙන් යට වූ විට ද, සෙනසුන ජලයෙන් යට වු කල ද, මේවා අන්තරායකර යැයි සිතා යායුතු බවත් එහිදී වස් කැඩීම ගැන ඇවැත් නොවන බවත් පෙන්වා දී ඇත.[25] මෙම අවස්ථාවන්හී දී තම ජීවිතය ආරක්ෂා කරගැනීම වඩාත් වටිනා බැවින් වස් කැඩීයාම පිළිබඳව නොසිතා එවැනි පීඩාවන්ගෙන් මිදී එයින් ඉවත් වී යාමෙන් ඇවැත් නොවන බව පෙන්වා දී ඇත.[26]

එකල එක්තරා ආවාසයක් වස් විසූ භික්ෂුන්ගේ ගම සොරුන් විසින් පළවා හරින ලදි. භාග්‍යවතුන් වහන්සේට මේ බව දන් වු විට "මහණෙනි" ගම යම් තැනෙක ද එහි යාමට නියම කරමි.[27] යනුවෙන් දක්වා ඇත. මේ අයුරින් වෙනත් තැනකට ගිය පසුව ගම කැඩී වෙන්විය. මෙහි දී භික්ෂූන්ට මතුවු ගැටළුව වුයේ තමන් කුමන පිරිස සමඟ එක්වී කටයුතු කරන්නේ ද යන්නයි. එයට විසඳුම ලෙස බුදුරදුන් පෙන්වා දුන්නේ "මහණෙනි, බොහෝ දෙනා යම් තැනෙක ද එහි යාමට නියම කරමි."[28] යනුවෙනි. ඒ අනුව භික්ෂූන් වැඩි පිරිස හා එක්විය. නමුදු එම වැඩි පිරිස ශ්‍රද්ධා රහිත වුවත් බැවින් ඒ පිළිබඳ කෙසේ කටයුතු කළයුතු දැයි ගැටළුවක් භික්ෂුන්ට මතුවිය. මේ පිළිබඳ බුදුරජාණන් වහන්සේට සැළ කළ විට භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දී ඇත්තේ ශ්‍රද්ධාවතුන් හා එක්විය යුතු බවයි."[29]

මීට අමතරව එම සමජයන් තුළ මතු වු විවිධ කරුණු කාරණා පිළිබඳව සළකා බලා බුදුරජාණන් වහන්සේ ඊට යම් යම් සහන ලබා දී ඇත. විටෙක භික්ෂූන්ට ප්‍රමාණවත් පරිදි ආහාර නොලැබීයාමෙන් දුෂ්කරතාවයන්ට ලක්වන්නට සිදුවිය. එහිදී බුදුරදුන් මෙම තත්වය අන්තරායකරයැයි සළකා යායුතු බවත් එහි දී වස් කැඩීම නිසා ඇවැත් සිදු නොවන බවත් පෙන්වා දී ඇත.[30] ප්‍රමාණවත් පරිදි ආහාර නොලැබ් ගිය විට සිරුර පවත්වාගෙන යාමේ දුෂ්කරතාවයන්ට ලක්වන්නට සිදුවේ. තව ද රෝග පීඩාදියට ද ගොදුරු වේ. එබැවින් එය ජීවිතය රැක ගැනීමට අන්තරායකාරී වන බව පෙනේ. මීට අමතරව අවශ්‍ය පමණ බෙහෙත් ආදිය නොලැබුණු කල්හි ද වස් ගැන නොසිතා එම ස්ථානයෙන් බැහැර වීමට අවසර ලබා දී ඇති බව ද පෙනේ.[31] වස් වසන භික්ෂුන් එකම වයස් කාණ්ඩයකට අයත් නොවේ. විවිධ වයස් තලවලට අයත් භික්‍ෂූන් ඒ අතර වේ. බොහෝ වයසැති ගිලන් වු භික්ෂුන් ද මේ අතර සිටිති. ඔවුන්ට තම කටයුතු තනිවම කරගෙන යාමේ දුෂ්කරතාවන් ඇතිවන බැවින් එබදු භික්ෂූන්ට උප්සථායකයකුගේ සහය අවශ්‍ය වේ. එනමුදු ඇතැම් ස්ථානයන්හි උපස්ථායකයෙකුගේ සහය නොලැබී ගිය විටක වස් කැඩී ගිය ද එය නොසළකා එයින් ඉවත් වීම තුළ ඇවැත් නොවන බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දී ඇත.[32]

මීට අමතරව වස් විසූ ආරාමය වෙනස් කළ හැකි අතිරේක හේතු ප්‍රමාණයක් ද වස්සූපනායිකඛන්ධකයේ දී දක්වා තිබේ. මුලින් දැක් වූ ස්ථානයන් ජීවිතයට අන්තරායකර වේ යැයි සිතා වස් ගැන නොසිතා අතහැර දැමීය යුතු බව දක්වා ඇති අතර පහත දැක්වෙන කරුණු වලින් පැහැදිලි වන්නේ මහණකමට යම් අන්තරාවක් වේ නම් එබඳු ස්ථාන වලින් ඉවත් විය යුතු බවයි. එහි සඳහන් වන පරිදි යම් ස්ත්‍රියකගේ අයුතු ඉල්ලීමක් හේතුවෙන් මහණකමට අන්තරාවක් වේ යයි දැනුණොත් එබඳු ස්ථාන අතහැරිය යුතු බවත්,[33] යම් වෛශ්‍යාවකගේ වැරදි ඉල්ලීමක් නිසා මහණකමට බාධාවක් වේයැයි සිතුනොත් එම ස්ථානය අත්හැරීමේන් ඇවැත් නොවන බවත්,[34] තමන් වස් විසූ තැන ධන නිදාන මතුවීම නිසා තම හිත වෙනස් වීමෙන් මහණකමට නපුරක්වේයැයි හැඟුනොත් එම තැන අත්හැරීමෙන් ද ඇවැත් නොවෙන බවත්,[35] තමා වසන අරමෙහි භික්ෂූන් සංඝභේදයට සූදනම් වුවහොත් එම ස්ථානය අත්හැරීම සුදුසු බවත්,[36] තවත් තැනෙක භික්ෂූන් සංඝ භේදයක් කළ බව දැන එය සංසිඳවීමේ අදහසින් යාහැකි බවත්,[37] එවැනි අවස්ථාවන්හි දී වස් සිඳීමෙන් ඇවැත් නොවන බවත් දක්වා ඇත.

වස් විසීම පිළිබඳ කථා කිරීමේ දී වස් වසන්නට සුදුසු නුසුදුසු ස්ථානයන් පිළිබඳව විමසා බැලීම වටී. මේ පිළිබඳව විමසීමේ දී භාග්‍යවතුන් වහන්සේ වස් විසීම සඳහා අවසර ලබා දී ඇති සුවිශේෂී ස්ථාන තුනක් පිළිබඳව සඳහන් වේ. එකල එක් භික්ෂුවක් ගැලක වස් විසීමට කැමතිව භාග්‍යවතුන් වහන්සේට ඒ බව සැලකළ විට "මහණෙනි, ගැලෙහි වස් එළඹෙන්නට අනුදනිමි යි[38] ප්‍රකාශ කරමින් ඊට අවසර ලබා දී ඇත. ගැල සැමවිටකම එක් ස්ථානයක රඳවා තබන්නක් නොවේ. ගැල අන්තැනකට ගිය විට එහි යන්නට ද ඒ අනුව අවසර ලබා දී ඇත. මීට අමතරව තවත් භික්ෂුවක් නැවක යාමට කැමතිව ඒ පිළිබඳව බුදුරදුන්ගෙන් විමසූ කල බුදුරදුන් නැවෙහි වස් වසන්නට ද අවසර ලබා දී ඇති බව පෙනේ.[39] එකල තවත් භික්ෂු පිරිසක් තම අභිමතය පරිදි ගස් සිදුරු වල, ගසෙහි අතු බෙදී ගිය තැන් වල, එළිමහනෙහි, සොහොන් කිළියෙහි, කුඩයක් යට, ලොකු සැලි වල යනාදී තැන්වල වස් වසන්නට පටන් ගත් අතර ඒ පිළිබඳ මිනිසුන්ගෙන් එල්ල වූ චෝදනා මුල් කර ගනිමින් එබඳු තැන් වල වස් විසීම නොකළ යුතු බව භාග්‍යවතුන් වහන්සේ දක්වා ඇත.[40] එසේම සෙනසුනක් නොමැතිව ද වස් නොඑළඹිය යුතු යැයි දැක්වූහ.

වස් සමාදානය සඳහා යම් ස්ථානයක් සුදුසු වන්නේ පියස්සක් හා දොරක් සහිත වීම යන කරුණු දෙක සම්පූර්ණ වීමෙන් බව පැවසේ.[41] පියස්ස උළුවලින් සෙවෙනි කළ (ඉට්ඨිකාච්ඡදන), ගලින් සෙවෙනි කළ (ශිලාච්ඡදන), ගඩොලින් සෙවෙනි කළ (සුධාච්ඡදන), තණ වලින් සෙවෙනි කළ (තෘණච්ඡදන), පිදුරු, කොළ අතු, පැළලි ලෑලි, යනාදී ඒවායින් සෙවණි කළ එකක් වියහැකි බව සඳහන් වේ.[42] වස් සමාදන් වන්නේ වැසි කාලයක වන බැවින් පියස්සක් අත්‍යවශ්‍යමය. එසේම වැසි කාලයේ වාසස්ථාන සොයා පැමිණෙන සතුන්ගෙන් ආරක්ෂාවීම සඳහා දොරක් සහිත තැනක් වීම ද වැදගත් වේ. එබැවින් මෙම ප්‍රඥප්ති භික්ෂූන්ගේ ආරක්ෂාව සඳහා හේතු වූ බව පෙනේ.

වස් කාලය ඇතුලත කිසිවෙක් පැවිදි නොකරමු යැයි ඇති වූ කතිකාවතකින් විශාඛාවගේ මුණුබුරෙකුට පැවිදිවීමේ අවස්ථාව ගිලිහී යාම නිසා එය මුල් කරගනිමින් වැසි කාලය තුළ පැවිදි නොකරමු යැයි කතිකාවක් ඇති නොකරගත යුතු බවත් එසේ කරයිනම් දුකුළා ඇවතක් සිදුවන බවත්

සඳහන් වේ.[43] වස් කාලය ගත කිරීමට කෙනෙකු ආරාධනා කරයිනම් ඔහුගේ උපකාර ලබමින් එහි වස් විසිය හැකි ය. වරක් උපනන්ද තෙරුන්ට කොසොල් රජු වස් ආරාධනා කළ අතර එය උපනන්ද හිමියන් පිළිගත් නමුදු ඒ වසට වඩින අතරතුර දී බොහෝ සිවුරු ඇති ආවාස දෙකක් හමු වී ඇති අතර උන්වහන්සේ රජුගේ වස් ආරාධනාව පිළිබඳ නොසළකා ඒ ආවාස දෙකෙහි වස් සමාදන් වූ බව සඳහන් වේ.[44] උපනන්ද තෙරුන්ගේ මෙම ක්‍රියාකලාපය පදනම් කොටගනිමින් කිසිදු භික්‍ෂුවක් එසේ නොකළ යුතු බවත්, මුලින් පොරොන්දු වී පසුව එය කඩ කරයි නම් ඔහුට පෙරවස අහිමි වන බවත්, පොරොන්දු වීම නිසා ඇවැත් සිදුවන බවත් ප්‍රකාශ කොට ඇත.[45] මෙමඟින් ප්‍රකාශවන වැදගත්ම පණිවිඩය වන්නේ වස් විසිය හැක්කේ එක් ස්ථානයක පමණක් වන බවයි. පිරිකර අපේක්‍ෂාවෙන් බොහෝ විහාරයන්හි වස් සමාදන් වීමට මෙමඟින් භික්‍ෂුවට අවස්ථාවක් නොමැත.

වස් කාලය පිළිබඳ විමසීමේ දී වැසිසළුව ද අමතක කළ නොහැක්කකි. වැසිසළුව වස් කාලයට පමණක් සීමා වූ අතිරේක සිවුරකි. වස් වසන දිනයේ දී විහාරස්ථානයේ දායකයන් දැහැත් ගොටු සමඟ නානකඩයකට ප්‍රමාණවත් සුදු රෙදි කඩක් පුදා වස් විසීමට දැහැත් ගොටු පූජා කරනු ලබයි. කෙසේ වෙතත් වැසිසළුව වස් වසන දිනයේ ම අධිෂ්ඨාන කළයුතු අතිරේක සිවුරක් හෝ නානකඩයක් බව පෙනේ. වැසිසළුව පිළිබඳ අවස්ථා හතරක් ඇති බව සඳහන් වේ.[46] විශාඛාව යාව ජීව වශයෙන් වස් කාලයේ වැසි සළු පූජා කිරීමට භාරගෙන තිබේ.

වස් වසන භික්‍ෂුව ඉහත සඳහන් සියලු කරුණු කාරණා පිළිබඳව අවධානය යොමු කරමින් වස් විසිය යුතු ය. වස් විසීමට සුදුසු සෙනසුනක් කරවාදෙන දායකයෙක් වේ නම් මැනවි. නොවේ නම් තමාම සුදුසු තැනක් සොයා අඩුපාඩු සකස් කොට පිළියෙල කරගත යුතු ය. වස් වසන භික්‍ෂුව කල් ඇතිව වස් අරමට යාම කල යුතු ය. නියමිත දිනයෙහි බෝමළු, සක්මන් මළු ආදිය ඇමද, පානීය පරිභෝජනීය පැන් සපයා, ආරාම පිරිසිදු කර, වන්දනා මානාදිය කර, වත් පිරිත් කියා වස් විසිය යුතු ය. ඒ සඳහා නියමිත වාක්‍ය ඉමස්මිං විහාරෙ ඉමං තෙමාසං වස්සං උපෙමි"[47] කියා වස් එළඹිය යුතුය. යම් භික්ෂුවක් වස් වසන අදහසින් විහාරයට පැමිණි විට නියමිත දින වස් අධිෂ්ඨාන කිරීමට අමතක වුව ද වස් වීසිමේ බලාපොරොත්තුවෙන් පැමිණි හෙයින් වස් විසීම සිදු වේ. වස් කඩා නොගෙන විසුවහොත් ඒ භික්ෂුවට පවාරණය කිරීමට බාධාවක් නැති බව රේරුකානේ චන්දවිමල හිමියෝ පෙන්වා දෙති.[48] යම් ගිලන් බවකින් යුක්තව සිටි භික්ෂුවකට පෙරවස් ඉටාගැනීමට නොහැකි වූ විට පසු වස් ඉටාගත යුතුය.

බෞද්ධ භික්ෂුව කොයි රටක කොතැනක වුවත් වස්සාන කාලය නම් පෙරවස් හෝ පසුවස් විසිය යුතුය. මෙය ආරාධනා ඇතත් නැතත් කළ යුත්තකි. ඒ බව කඨිනය අනුදැනීමට හේතු වු පාවෙය්‍යක භික්ෂූන් බුදුන් දැකීමට යන අතරමඟ වස් කාලය පැමිණි බැවින් සාකේත නගරයෙහි වස්විසූ බව සඳහන් වීමෙන් පෙනීයයි.[49] වර්තමානයේද ලෝකයේ කොතැනක සිටියද උපසම්පදා බෞද්ධ භික්ෂූන් මේ උතුම් චාරිත්‍රය නොකඩ කොට පිළිපදියි. වස් තුන් මාසය විශේෂ පුණ්‍ය කාලයක් ලෙස සළකා ගිහි පැවිදි දෙපිරිසම විවිධ වු කටයුතු වල නිරත වේ. බුද්ධ පුජා, බෝධි පුජා, පිරිත් දේශනා ආදිය දිනපතා සිදු කරන විහාරස්ථානයන් වර්තමානයේ දී දැකගත හැකිය.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර දෙව්රම් වෙහෙර වැඩ වසන කල්හි කොසොල් ජනපදයේ එක්තරා ආවාසයක වස් විසූ භික්ෂූන් ඔවුනොවුන් සමඟ කතා නොකොට වස් තුන් මාසය ගත කිරීම නිසා පවාරණය කිරීමට නියම කරන ලද බව සඳහන් වේ.[50] වස් පවාරණය යන්නෙන් මූලිකවම අදහස් කරන්නේ වස් කාලය තුළ දී තමාගේ කිසියම් වරදක් දැකීමෙන් හෝ ඇසීමෙන් හෝ සැක කිරීමෙන් හෝ වරදක් සිදුවී ඇත්නම් එයට අනුකම්පාකොට තමාට එය ප්‍රකාශ කරන ලෙස සංඝයාගෙන් ඉල්ලා සිටීමයි. වස් තුන් මාසය තුළ එක්ව කටයුතු කිරීමේ දී ඔවුනොවුන් පිළිබඳ අවබෝධයක් ඇතිවන බැවින් ඉතා කුඩා හෝ වැරැද්දක් යම් භික්‍ෂුවක් කරන්නේ නම් එය අනෙක් භික්‍ෂූන්ට තේරුම් ගත හැකි ය. භික්‍ෂූන් අතර හිත් අමනාපකම් ඇති නොවන පසුබිමක් නිර්මාණය කිරීමට මෙමඟින් උත්සහ ගෙන ඇත. එක් භික්ෂුවකගේ හැසිරීම් රටාව තවත් භික්ෂුවකට හිංසාකාරී පීඩාකාරී හෝ අසහනකාරීත්වය පිණිස හේතු විය හැක. වස තුන් මස ගෙවී යාමෙන් අනතුරුව සියලු දෙනා එක්වී පවාරණය කරන්නේ එබැවිනි.

පවාරණ දිනය ව්‍යක්ත වු ප්‍රතිබල භික්ෂු නමක් විසින් භික්ෂූන් වහන්සේලාට දැනුම් දෙන්නේය.[51] පවාරණ වාක්‍ය එක් එක් භික්ෂුව විසින් සෙසු භික්ෂූන් ඉදිරිපිට තනිපට සිවුර ඒකාංශ කොටගෙන උක්කුටිකයෙන් හිඳ ප්‍රකාශ කළ යුතුය. එහි දී වැඩිමහළු භික්ෂුව "ආවුසෝ" යැයි ඇමතිය යුතු අතර සෙසු සියලු දෙනා "භන්තේ" යනුවෙන් ඇමතිය යුතු බව සඳහන් වේ.[52] ඡබ්බග්ගිය භික්ෂූන්ගේ හැසිරීම් නිසා ස්ථවිර භික්ෂූන් පවාරණය කරන කල්හි සියලු දෙනා උක්කුටිකයෙන් හිඳිය යුතු බව දක්වා ඇත.[53] මෙම නියමය දුර්වල වු එක් භික්ෂුවක් උක්කුටිකයෙන් හිඳිද්දී සිහි නැතිව වැටීමෙන් වෙනස් කරන්නට සිදු වී ඇත.

භික්ෂූන් වහන්සේලාගේ සමගිය පිළිබඳ කෙතරම් දුරට අවධානය යොමුකර ඇද්දැයි පවාරණ කර්ම හතර තුළින් ධර්මයෙන් සමගිව කරන්නා වු පවාරණ කර්මය පමණක් අනුමත කිරීමෙන් පෙනී යයි.[54] සැම විටම භික්ෂූන්ගේ සුහදත්වය ආරක්ෂා කරගැනීමට කටයුතු කර ඇති බව මෙයින් පෙනී යයි. පවාරණයට සියලු භික්ෂූන් සහභාගි විය යුතු වුව ද ගිලන් භික්ෂුව විෂයෙහි මෙම තත්වය වෙනස් වේ. ගිලන් වූ භික්ෂුවට පවාරණයට සහභාගි විය නොහැකි බැවින් පවාරණය දීමට අනුදැන වදාරා ඇත.[55] මේ තුළින් එම භික්ෂුවගේ දායකත්වය ද යම් ආකාරයකින් ලබා ගැනීමට කටයුතු කර ඇති බව පෙනේ. වඩාත් රෝගි වු යම් භික්ෂුවක් වේ නම් එම භික්ෂුව ඇඳෙන් සෙලවීමට පවා අසීරු නම් එමඟින් භික්ෂුවගේ රෝගී තත්වය වඩාත් දරුණු අතට හැරේ නම් එම භික්ෂුවගේ ඇඳ සමීපයට පැමිණ පවාරණය කළ යුතුය.

තවද ඇවැත් වලට ලක් නොවී පවාරණය කළ යුතු ආකාරයන් පසළොසක් පිළිබඳව සඳහන් වේ.[56] එසේම දුකුළා ඇවැත් වන කරුණු පසළොසක් පිළිබඳව සඳහන් වේ.[57] මේ සියලු අවස්ථා පෙන්වා දෙමින් භික්ෂූන්ගේ සමගිය ආරක්ෂා කරමින් එකී සංඝ කර්මයන් කළ යුතු බව දන්වයි. විමති ඇතිව පැවරූ කල්හි ද දුකුළා ඇවැත් වන බව වැඩිදුරටත් පෙන්වා දී ඇත.[58] ඒ පිළිබඳ කරුණු 15 ක් සඳහන් කරයි. මෙමඟින් අපේක්ෂා කරන්නට ඇත්තේ භික්ෂූන් ඔවුනොවුන් කෙරෙහි විරුද්ධවීම් වලක්වා නිවැරදි අවබෝධයෙන් යුතුව එම අවස්ථාවට සහභාගී වීමට ඉඩ සැළසීමයි. ඒ පිළිබඳව ද කුකුසක් වේ නම් එය නිරාකරණය කරගත යුතුය. එසේ නොමැතිව කුකුසින් යුතුව පවාරණය කළේ

නම් එයින් දුකුළා ඇවැත් වන බවත් කුකුස් ඇතිවිය හැකි කාරණා පසළොසක් පිළිබඳවත් සඳහන් වේ.[59]

පවාරණ කර්මය හුදෙක් ම එක්ව විසූ භික්ෂූන් වෙන්ව යාමේදී ඔවුනොවුන් තුළ සමගිය බිඳී යා නොදී ඉදිරියටත් ඔවුනොවුන්ගේ සහයෝගය රැකීමේ අරමුණින් පනවා වදාළ වූවක් බව පෙනේ. පවාරණ කර්මයට සියලු භික්ෂූන්ගේ දායකත්වයට අපේක්ෂා කෙරේ. නමුදු ඇතැම් භික්ෂූන් එය ඉක්මවා ගිය බව පෙනේ. යම් ආකාරයකින් ආවාසික භික්ෂූන් ඇති බව දැන මේ මහණහු නැසෙත්වා මේ මහණහු වැනසෙත්වා ඔවුන්ගෙන් කිනම් වැඩෙක්දැයි බිඳීමේ අදහස පෙරටු කොටගෙන පවරත්නම් පැවරූ පසුව එන භික්ෂූන් ද පැවරිය යුතුය. පැවරූ භික්ෂූන්ට තුලැසි ඇවැත් වන බවත් එවැනි අවස්ථා පහළොවක් පිළිබඳ සඳහන් වේ.[60] භික්ෂූන් වෙන් වෙන්ව පැවැරීම තුළින් ඔවුන්ගේ විරෝධාකල්පයන් තවදුරටත් දියුණු වීමට අවස්ථාව උදාවන බැවින් සියලු අවහිරතාවන් මගහරවා ගනිමින් එක්ව පවාරණය කළ යුතු බව දක්වා ඇත.

තුන් වරක් කියා පවාරණය කළ යුතු වුව ද කොසොල් දනව්වේ එක් ආවාසයක භික්ෂූන්ට වැද්දන්ගෙන් ඇති වූ බියක් හේතු කොටගෙන එසේ කිරීම අසීරු විය. මෙය මුල් කොට ගනිමින් කෙසේ හෝ පවාරණය කළ යුතු බැවින් දෙවරක් කීමෙන් පවරන්නට අනුදැන වදාරා ඇත.[61] වැදි බිය දැඩි වූයෙන් දෙවරක් කීමෙන් පවරන්නට නොහැකි විය. එබැවින් මෙම තත්ත්වය සළකා බලා එක් වරක් කීමෙන් හෝ එසේ කළ නොහැකි නම් සමාන වස් ඇති භික්ෂූන් එකවර කියා පැවරිය යුතු බව දක්වා ඇත.[62] ඇති වූ ගැටළුකාරී තත්ත්වයන් මඟහරවා ගනිමින් අවස්ථානුකූලව එයට සුදුසු විකල්ප තත්ත්වයන් ඉදිරිපත් කොට ඇත. මේ අයුරින් භික්ෂූන්ට ද හිරිහැරයක් බාධාවක් නොවන අයුරින් එකී කාර්යයන් ඉටුකිරීමේ අවස්ථාව සළසා දී ඇති බවක් පෙනේ.

එකල්හි එක් ආවාසයක දන් දෙන්නා වූ මිනිසුන් විසින් රාත්‍රිය බොහෝ කොට ගෙවීම නිසා ද දෙවරක් හෝ එක් වරක් කීමෙන් හෝ සමාන වස් ඇති අය එක්ව කීමෙන් පවාරණය කළ යුතු බව සඳහන් කරයි.[63] මීට අමතරව දහම් දෙසීම, සූත්‍ර සංගායනා, විනය විසඳීම් ධර්ම සාකච්ඡා මෙන් ම කළහා කරන භික්ෂූන් නිසා ද රාත්‍රිය බොහෝ සෙයින් ගෙවී ගිය විට ද ඉහත දැක් වූ අයුරින් දෙවරක් එක් වරක් හෝ සමාන වස් ඇති අය එක්ව පැවරීම කළ යුතු බව පෙන්වා දී ඇත.[64] විවිධ කටයුතු මුල්කරගනිමින් පවාරණ කටයුත්ත මඟහැරීමට යම් භික්ෂු පිරිසක් උත්සහ දරයි නම් මෙමගින් එවැනි ඉඩකඩ අහුරා ඇති බව පෙනේ. කොසොල් දනව්වේ එක් විහාරයක පවාරණ දිනයෙහි බොහෝ භික්ෂූන් රැස්ව සිටි අතර වර්ෂාවක පෙර නිමිති පහළ වූ බැවින් නොතෙමී සිටිය හැකි ස්ථානයන් ද සීමිත වූ බැවින් තුන් වරක් කීමෙන් බොහෝ වේලා ගතකළ හොත් වර්ෂාවට හසුවන නිසා දෙවරක්, එක්වරක් හෝ සමාන වස් ඇති භික්ෂූන් එකතුව කීමෙන් හෝ පවාරණය කළ යුතු බව දක්වා ඇත.[65] මීට අමතරව රජුන්ගෙන්, සොරුන්ගෙන්, ගින්නෙන්, ජලයෙන්, මිනිසුන්ගෙන්, අමනුෂ්‍යයන්ගෙන්, චණ්ඩ මෘගයන්ගෙන්, සර්පයන්ගෙන් ජීවිතයට හෝ බ්‍රහ්ම චර්යාවට අන්තරායක් වේ නම් තුන් වරක් කීමෙන් පවාරණය අපහසු බැවින් දෙවරක් හෝ එක්වරක් හෝ සමාන වස් ඇති භික්ෂූන් එකතුව කීමෙන් හෝ පවාරණය කළ යුතු බව පෙන්වා දී ඇත.[66] පවාරණය පිළිබඳ විවිධ අනු ප්‍රඥප්ති පැනවීමට සවග මහණුන් හේතු වූ බව පෙනේ.

සවග මහණුන් ඇවැත් සහිතව පැවරීම නිසා එසේ පැවරීම නොකළ යුතුයැයි ශික්ෂාවන් පනවන්නට සිදු වී ඇත.[67] ඇවැත් සහිතව යම් භික්ෂුවක් පවරන්නේ නම් ඉඩ ලබාගෙන චෝදනා කළ යුතු විය. නමුදු සවග මහණුන් ඉඩ ලබා නොදී පවරන්නට වූ බැවින් එවැනි අවස්ථා වලදී පවාරණය නවත්වන්නට අනුදැන වදාරා ඇත.[68] මෙම පැනවීම ද තම වාසියට හරවාගත් සවග මහණුන් ශික්ෂාකාමී භික්ෂූන්ගේ පවාරණය නැවැත්වීමට කටයුතු කර ඇත. මෙම තත්ත්වය හේතුකොට ගෙන හේතුවක් නොමැතිව නිකරුණේ පිරිසිදු භික්ෂූන්ගේ පවාරණය නොනැවැත්විය යුතු බවත් එසේ කරයි නම් ඇවැත් සිදුවන බව පෙන්වා දී ඇත.[69] චෝදනා එල්ල කරන්නන් අපිරිසිදු වචී සමාචාර හා කාය සමාචාර ඇත්තේ වී නම් එවැනි අවස්ථාවල ඔවුන්ගේ චෝදනා ඉවතලනු ලබයි. යම් භික්ෂුවක් සීල විපත්තියකට, දෘෂ්ටි විපත්තියකට, ආචාර විපත්තියකට ලක්ව ඇත්නම් එබඳු අවස්ථා වලදී ඒ පිළිබඳ විමසිය හැකි ය, දැකීමෙන් ඇසීමෙන් හෝ සැක කිරීමෙන් යනාදී කවර අයුරකින් චෝදනා එල්ල කරන්නේදැයි විමසිය යුතුය. යම් භික්ෂුවක් පාරාජික සංඝාදිසේස පාටිදේසනීය ආදී ඇවතකට ලක්ව එය පිළියම් කළ පසු පැවරීම කළ හැකිය. තව ද භික්ෂූන් යම් ආකාරයකින් අනෙක් භික්ෂූන්ගේ පවාරණය නවත්වමියි කතිකා කොට වස් වසා පවාරණයට පැමිණේ ද එවැනි අවස්ථාවන්හි දී ඔවුන් පැමිණෙන්නට ප්‍රථමව පවාරණය කර, ඔවුන් පැමිණි පසු අපි පවාරණය කළෙමුයි පවසා ඔවුන්ට පවරන්නට සැළැස්විය යුතු බව දක්වයි.[70] මේ අයුරින් කටයුතු කිරීමට අනුදැන වදාරා ඇත්තේ ඇතිවිය හැකි ගැටළුකාරී තත්ත්වයන්ගෙන් මිදීම සඳහා ය.

පවාරණය දින වශයෙන් චාතුද්දසී, පණ්ණරසී සාමග්ගී යනුවෙන් තෙවැදෑරුම් බවත්, සංඝ පවාරණය, ගණ පවාරණය, පුද්ගල පවාරණය යනාදී වශයෙන් තුන් ආකාර වන බවත් සඳහන් වේ.[71] උපෝසථ දිනයේ මෙන් ම පවාරණ දිනයේ ද ස්ථානය පිරිසිදු කිරීම, අසුන් පැනවීම, පැන් තැබීම, පහන් දැල්වීම ආදී මූලික කටයුතු සපුරාලිය යුතු ය. තනිව වුව ද මෙම සියලු කාරණා ඉටුකොට අවසන පවාරණය කළ යුතු ය. පවාරණ කර්මය වස් අවසන් වීමෙන් සිදු කෙරෙන බැවින් එය වස් අවසන් කිරීමකැයි වරදවා තේරුම් නොගත යුතු බව රේරුකානේ චන්දවිමල හිමියෝ පෙන්වා දෙති.[72]

පවාරණය කිරීමේ අරමුණ වන්නේ ඔවුනොවුන් අතර සමගිය සුහදත්වය ආරක්ෂා කිරීමයි. තවද පවාරණයේ දී යම් භික්ෂුවක් අතින් වැරැද්දක් සිදු වී ඇත්නම් එය පැවරීමට පෙර අනෙක් භික්ෂූන් පෙන්වා දීම තුළ භික්ෂූන් හැකිතරම් නිවැරදිව වස් තුන් මාසය ගත කිරීමට යොමු කරවනු ලබයි. ඒ තුළින් භික්ෂුවගේ ආධ්‍යාත්මික සංවර්ධනයක් ද ඇතිවන බව පෙනේ. මෙම කරුණු දෙස විමසීමේ දී පෙනීයන්නේ පවාරණය වූ කලි භික්ෂූන්ගේ සමගිය සහයෝගය ආරක්ෂා කරන්නක් සේම ආධ්‍යාත්මික සංවර්ධනයක් කරා ද භික්ෂූන් මෙහෙයවන උතුම් සංඝ කර්මයක් වන බවයි.

වස් වසා පවාරණය කළ භික්ෂුවට කඨිනයක් අනුදැන වදාරන්නට හේතු වූ කාරණාව පිළිබඳව ද විමසා බැලීම වටී. භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර වැඩවාසය කරන සමයෙහි පාවා නුවර වැසි භික්ෂූන් පිරිසක් බුදුරදුන් හමුවීමට පැමිණෙන අතරතුර වස් කාලය ළගා වූ බැවින් සාකේත නුවර වස් විසූහ. මෙම භික්ෂූන් වහන්සේලා කොසොල් රජතුමන්ගේ සොහොයුරන් වූ භද්දවග්ගිය භික්ෂූන් වහන්සේලා බව රේරුකානේ චන්දවිමල හිමියන් පෙන්වා දෙයි.[73] වස් තුන් මස ගෙවී ගිය පසු

පවාරණය කළ එම භික්ෂු පිරිස බුදුරදුන් හමුවීමට පැමිණ ඇත. වර්ෂාව නිසා තෙත බරිත වූ සිවුරු ඇතිව ඉතා පීඩාකාරී ලෙස පැමිණි මෙම පිරිස මුල්කොට ගනිමින් අතිරේක සිවුරක් තිබුනේ නම් මෙම පිරිසට මෙසේ පීඩාකාරී නොවිය යුතුයැයි සළකා කඨිනය අනුදැන වදාරා ඇත.[74] පෙරවස් වසා සිඳ නොගත් මහා පවාරණයෙන් පැවරූ භික්ෂූන්ට කඨිනස්ථරණය කිරීමට ඉඩ ලබා දී ඇත. මේ අනුව පෙනී යන වැදගත්ම කරුණක් වන්නේ කඨින චීවරයක් ලැබීමට නම් පෙරවස් විසීම වැදගත් කරුණක් ලෙස සළකා ඇති බවයි. වස් ඡේදනය වූ හෝ පසු වස් විසූ භික්ෂූන්ට කඨිනය ලැබිය නොහැකි ය.

මහ පොළව මෙන් කිසි කලෙක කම්පා කළ නොහැකි වූ ද, මහාමේරු පර්වතය මෙන් නොසෙල්විය හැක්කා වූ ද, වජ්‍ර පර්වතයක් මෙන් නොබිඳිය හැක්කා වූ ද, ස්ථිර වූ අනුසස් රාශියක් දුන් දායකයන්ට ලැබෙන හෙයින් ද, එය අත්ථරණය කළ භික්ෂුවට එබඳුම වූ ස්ථිර අනුසස් පහක් ලැබෙන හෙයින් ද ඊට කඨිනය යැයි කියනු ලැබේ. තව ද බොහෝ අනුසස් නොවිසර පවත්නා අර්ථයෙන් හා සංග්‍රහ කරන අර්ථයෙන් ද, බුද්ධාදී උතුමන් විසින් පසස්නා ලද හෙයින් හා පසස්නා ලද අනුසස් ඇති හෙයින් ද කඨිනය නම් වන්නේයැයි සඳහන් වේ.[75]

කඨිනය ඇතිරීම පිළිබඳ කරුණු විසිහතරක් දක්වා එහි විපත්තීන්ගෙන් එකක් හෝ කිහිපයක් යෙදේ නම් කඨිනය නොඅතුරන ලද්දේ වේ යැයි සඳහන් වේ.[76] එසේම කඨිනස්ථරණයේ දී සම්පූර්ණ විය යුතු සම්පත් පිළිබඳව ද විස්තර කෙරේ.[77] කඨිනය අතුරන ලද හා නොඅතුරන ලද කාරණා පිළිබඳව බොහෝ තොරතුරු පරිවාර පාළියේ ද සඳහන් වේ.[78] කඨිනය ඇතිරීම සඳහා භික්ෂූන් පස් නමක්වත් සිටිය යුතුය. වස් විසූ භික්ෂූන් සතර නමක්, තුන් නමක්, දෙනමක් හෝ එක් නමක් වේ නම් වෙනත් භික්ෂූන් ගණ පූරණ ලෙස ගෙන කඨිනය ඇතිරිය යුතු ය. වෙනත් වෙහෙරක පෙරවස් විසූ සියලුම භික්ෂූන් කඨිනය ඇතිරීම සඳහා ගණ පූරණයට ඇතුලත් වේ. නමුත් කඨිනය අතුරන ලද විහාරයේ වස් විසූ අයෙකු නොවන බැවින් කඨිනය ඇතිරීමෙන් ලබන පංචානිසංස ලැබිය නොහැකි වන්නේ ය.[79] එම ආනිසංසයන්ට හිමිකම් ලබන්නේ එම වෙහෙරෙහි වස් විසූ භික්ෂූන් හට පමණි. වෙනත් වෙහෙරක භික්ෂූන් ගණ පූර්ණය උදෙසාම පමණක් දායක කරගනු ලබයි.

පෙරවස් විසූ භික්ෂුන් ඇති ආරාමයක වස් ඡේදනය නොවූ, මහා පවාරණයෙන් පැවරූ භික්ෂුවක් හෝ පස් නමකට නොඅඩු මහා සංඝයා ඉදිරියේ පෙරවස් පැවරූ තැන් පටන් පසු වස් පැවරීම දක්වා කාලය තුළ සංඝරත්නය උදෙසා කඨිනය පිළිගැන්විය හැකිය. මේ කාලය සාමාන්‍යයෙන් චීවර මාසය ලෙස ව්‍යවහාර කරනු ලබයි. කඨිනය පූජා කරන දායකයන් විසින් ධාර්මිකව උපයා සපයා ගත් දෙයින් තුන් සිවුරින් එක් සිවුරකට හෝ ප්‍රමාණවත් පිරිසිදු නොඉරුණු වස්ත්‍රයක් සංඝයා මධ්‍යයෙහි තබා සාංඝිකව පූජා කළ යුතු වන්නේය.[80] එසේම සිවුර මැසීම සඳහා අවශ්‍යවන ඉඳිකටු, පඬු ආදිය ද ලබා දිය යුතුය. චීවරයක් සඟසතු කොට පිදූ කල්හි මහා සංඝරත්නය සීමාවට රැස්ව එය දීමට සුදුසු භික්ෂුවක් තෝරා කඨිනය පැවරිය යුතුය.

කඨිනය සඳහා වස්ත්‍ර කිහිපයක්ම ලැබී ඇත්නම් එයින් වඩාත් සුදුසු වස්ත්‍රය තෝරා ගත යුතුය. කඨිනය දුර්වල සිවුරු ඇති භික්ෂුවකට දිය යුතුය. දිරූ සිවුරු ඇති භික්ෂුන් බෝහෝ වෙත්නම් එයින් වැඩි මහලු ස්ථවිර නමකට දිය යුතු බව ද වැඩිමහලු භික්ෂුවට එදම සිවුර කරවිය

නොහැකි නම් එයට සමර්ථ නවක භික්ෂුවකට දිය යුතුය. මහා ස්ථවිරයන් හට උපකාර කරන්නේ යැයි අනෙක් භික්ෂුන් පවසන්නේ නම් එය වැඩි මහලු ස්ථවිර භික්ෂුවට එය ලබාදිය යුතු බව සඳහන් කරයි.[81]

කඨින වස්ත්‍රය කැපුම් මැහුම් ආදි කටයුතු නොනිමි වස්ත්‍රයක් නම් කළ යුතු පූර්ව කෘත්‍යය හතක් ඇත. එම කටයුතු සියල්ල එදිනම කර නිමවා කඨිනය ඇතිරීම කළ යුතුය. එම පූර්ව කෘත්‍යය හත නම් සේදීම, නූල් ගසා කඩ වෙන්කිරීම, කැපීම, බොරුනූල් දමා කඩ එකතු කිරීම, මැසීම, පඬු පෙවීම, කප් බින්දු තැබීම යනාදියයි.[82] සංඝයා විසින් කඨින චීවරය පමුණුවනු ලැබූ භික්ෂුව විසින් තුන් සිවුරු අතරින් තමන්ට අවශ්‍ය චීවරය සඳහා එය යොදාගත යුතුය. පරිභෝග කරන ලද සිවුරු පච්චුද්ධරණය කොට අභිනව කඨින චිවරය කප් බින්දු තබා එය සංඝාටිය සඳහා නම් "ඉමාය සංඝාටියා කඨිනං අත්ථරාමි" යනුවෙන් ද එය උත්තරාසංඝය සඳහා නම් "ඉමිනා උත්තරාසංඝේන කඨිනං අත්ථරාමි" යනුවෙන් ද එය අන්තරාවාසකය සඳහා නම් "ඉමිනා අන්තරවාසකෙන කඨිනං අත්ථරාමි" යනුවෙන් ද තුන් වරක් කිව යුතු බව සඳහන් වේ.[83] ඉන් අනතුරු එම භික්ෂුව විසින් එම ස්ථානයේ පෙරවස් වසා පවාරණය කළ සියලු භික්ෂුන් රැස් කොට කඨිනය අනුමෝදන් කරවිය යුතුය. මේ අයුරින් කඨිනය අනුමෝදන් වූ භික්ෂුන්ට ද කඨිනය ලත් භික්ෂුවට මෙන් සියලු අනුසස් සම සමව ලැබෙන්නේය. කඨින චීවරය ලැබූ භික්ෂුව පැරණි සිවුර පරික්ඛාර චෝළ නාමයෙන් පච්චුද්ධරණය කොට කඨිනාස්ථරණය කළ යුතුය. මේවා වාග් භේදයෙන් ම කළ යුතුය.[84]

කඨිනයට එක් මූලයක් පමණක් වන බවත්, වස්තු තුනක් ඇති බවත්, භූමීහු හයක් ඇති බවත් දක්වයි.[85] භූමීහු හය නම් කොමු පිළි, කපු පිළි, තිහිරි පිළි, කම්බල, හණවැහැරි, මුසු පිළි ආදි සය ආකාර වස්ත්‍රයි. එකල සිවුරු සකස් කරගැන්ම අද මෙන් පහසු කටයුත්තක් නොවූ බව පෙනේ. කඨිනය අතුරන්නට සුදුසු පුද්ගලයා අංග අටකින් යුක්ත විය යුතු බව සඳහන් වේ.[86] එනම් පුබ්බකරණ, පච්චුද්ධාරය, අධිට්ඨානය, අත්ථාරය, මාතෘකාව, පළිබෝධය, උද්ධාරය, ආනිසංස යනාදිය දනී නම් එම භික්ෂුව කඨිනය අතුරන්නට සුදුසු වන බවයි. කඨිනයක් ඉල්ලා ලබාගැනීම නුසුදුසු වන අතර එය මවටවත් කියා ලබා නොගත යුතු අහසින් වැටුණාක් මෙන් ලද වස්ත්‍රයක්ම වියයුතු බව දක්වයි.[87] එනමුදු යම් දායකයෙක් කඨිනයක් පුජා කරන්නේ කෙසේද ආදී වශයෙන් කඨිනය පිළිබඳව විමසන්නේ නම් ඒහිදී ඒ පිළිබඳව දායකයාට කියා දීම කළයුතුය. තම අවශ්‍යතාව මත දායකයන් හැසිරවීම නොකළ යුතුය. කඨිනස්ථරණය වැඩෙන හා නොවැඩෙන අවස්ථා තුන බැගින් පෙන්වා දී ඇත.[88]

කඨින පුජාව දායකයාටත් ප්‍රතිග්‍රාහකයාටත් එකසේ පින් ලැබෙන මහා කුශලයකි. කඨිනයක දී විනා අනෙක් කවර දානයකදීවත් දන දෙකක් නොලැබේ. අවුරුද්දක් තුල එක තැනකදී ලැබිය හැක්කේ එකම කඨිනයක් නිසා කඨින පුජාව දුර්ලභ දානයක් වන්නේය. කඨින දානයෙන් සිද්ධ නොවෙන්නාවූ යම්කිසි සම්පත්තියක් නැත්තේමය. චක්‍රවර්තී සම්පත් ආදී වූ මිනිස් ලොව ලැබිය හැකි උතුම් ම සම්පත්තිය ද ශක්‍ර සම්පත් ආදි වූ දිව්‍ය සම්පත්තිය ද අවසාන වශයෙන් සම්‍යක් සම්බෝධිගාමී නිර්වාණ සම්පත්තිය ද යන සියලු සම්පත් කඨින දානයෙන් ජනිත කුශල ධර්මයෙන් සිද්ධ වන්නේය. කඨින පින්කම අට මහ පින්කම් අතුරින් පළමු පින්කම ද වන්නේය. වසරකට එක්

තැනෙක එක් වරක් පමණක් කළ හැකි මෙම පුණ්‍ය කර්මය සෑම විහාරස්ථානයක්ම කේන්ද්‍ර කර ගනිමින් මහත් උත්සවශ්‍රීයෙන් සමරනු ලබයි. කඨින පින්කමේ ආනිශංසයන් පිළිබඳව විවරණය කෙරෙන බොහෝ අවස්ථාවල දී නාගිත තෙරුන්ගේ කතා පුවත දක්වා ඇති අයුරු පෙනේ.[89] නිරය තිරිසන් ආදී වූ සතර අපායන් වල උත්පත්තිය නොලබා බොහෝ ඇසූ පිරූ තැන් ඇතිව මනුෂ්‍ය හා දිව්‍ය සම්පත් ලබා ගන්නට කඨින පින්කම හේතු වන බව එමඟින් පෙන්වා දේ.[90]

කඨිනය තුළ භික්ෂුවට ආනිසංස පහක් ලැබෙන බව සඳහන් වේ.[91] ඒවා නම් අනාමන්තචාර, අසමාදානචාර, ගණ භෝජන, යාවදත්ථ චීවර, චීවරුප්පාද යනාදියයි. සාමාන්‍යයෙන් භික්ෂුවකට නොවිචාරා ගම් වැදිය නොහැකිය. ආරාමික භික්ෂුවකට නොදන්වා යම් කිසි භික්ෂුවක් ගම් වදී නම් එම භික්ෂුවට පචිති ඇවතක් සිදු වේ. අනාමන්තචාර නම් එසේ නොවිචාරා ගම් වැදීමට දී ඇති අවසරයයි. කඨිනය ලැබූ භික්ෂුවට හේමන්ත ඍතුව අවසාන වන තුරුම තමාට කැමති පරිදි කිසිම භික්ෂුවකට නොදන්වා දයක කුලයන්හි ඇවිදිය හැකි ය. මේ පළමුවන වරප්‍රසාදයයි.

අරුණ නැගෙන විට සෑම භික්ෂුවකගේ ම තිචීවරය අත්පස විය යුතුය. අඳනය හා තනිපට සිවුර හැඳ පොරවා සිටී නම් දෙපට සිවුර හෙවත් සංඝාටිය අත්පස තිබිය යුතුය. එසේ නොවුයේ නම් සිවුර නිසඟි වන අතර එම භික්ෂුවට පචිති ඇවැත් වේ. කඨිනය ඇතිරූ භික්ෂුවට එදින සිට හේමන්ත ඍතුව අවසාන වනතෙක් කාලය තුළ තුන් සිවුර අත්පසයෙහි නොමැතිව අරුණ නැගිය හැකිය. මෙය කඨිනය ඇතිරූ භික්ෂුවට හිමි දෙවන වරප්‍රසාදය වේ.

"යම් කිසිවකු එක තැනෙක හෝ වෙන් වෙන්ව හෝ භික්ෂූන් සතර නමක් වෙත ගොස් ස්වාමීනි අපගේ නිවසෙහි අහර ගැනීමට එනු මැනවැයි යනාදි ක්‍රමයෙන් කරන ලද නොකැප නිමන්ත්‍රණයකින් ලත් භෝජනය ද එසේම භික්ෂූන් සතර නමක් එක්ව හෝ වෙන වෙනම වුව ද යම් කිසිවකු වෙත ගොස් අප සතර නමට බත් දෙවයි කියා හෝ මට බත් දෙවයි කියා හෝ විඥප්තියෙන් ලත් භෝජනය ද ගණ භෝජනය නම් වේ.[92] ගිලන් සමය, සිවුරු පූජා කරන සමය, සිවුරු මසන සමය, නැව් නගින සමය, යන අවස්ථා හැර සෙසු අවස්ථාවක දී යම්කිසි භික්ෂුවක් ගණ භෝජනය කරයි නම් එම භික්ෂුවට පචිති ඇවැත් වේ. එහෙත් කඨිනය අතුළ භික්ෂුවට ගණ භෝජනය නියමිත කාලය තුළ දී අකැප නොවේ. මෙය තුන්වන වරප්‍රසාදයයි.

අධිට්ඨාන විකප්පනාදිය නොකරන ලද චීවරයක් දස දිනකට වඩා නොඉටා නොවිකපා පරිභෝග කිරීමෙන් භික්ෂූන්ට නිසඟි පචිති වන්නේය. නමුත් කඨිනය අතුළ භික්ෂුවට ඒ නියමිත කාලය තුළ එසේ කැමතිතාක් චීවර පරිභෝග කළ හැක. ඉන් ඇවැත් නොවේ. මෙය කඨිනය අතුළ භික්ෂුවට ලැබෙන හතර වන වරප්‍රසාදයයි.

කඨිනයක් ලැබූ භික්ෂුවට කඨිනය ලැබූ ආරාමයෙහි සාංඝික වශයෙන් හෝ මතක වස්ත්‍රාදිය වශයෙන් හෝ ලැබෙන චීවර අයිති වීම චීවරුප්පාදයයි. කඨිනය ඇතිරූ විහාර සීමාවෙහි මතක වස්ත්‍රයක් හෝ සංඝයාට දෙන ලද්දක් හෝ ආරාමය සතු දේපල වලින් උපන් ආදයමකින් ගෙන ආ වස්ත්‍රයක් හෝ යම් සාංඝික වස්ත්‍රයක් හෝ ලැබුණේ නම් එය කඨිනය ඇතිරූ භික්ෂුවට අයත් වේ. " යො ච තත්ථ චීවරුප්පාදෝ සො තෙසං භවිස්සති"[93] යනුවෙන් කඨිනය ඇතිරූ විහාරයෙහි යම්තාක්

සිවුරු ලැබීමක් වේද එය කඨිනය ඇතිරූ භික්ෂුවට අයත් වේ යැයි දක්වා ඇත. මෙය කඨිනය ඇතිරූ භික්ෂුවට ලැබෙන පස් වැනි වරප්‍රසාදයයි.

කඨිනය ඇතිරූ භික්ෂුවට ලැබෙන මෙම වරප්‍රසාදයන් අහිමි වන්නේ කඨිනුද්ධාරයෙනි. කඨිනය ලැබූ භික්ෂුවකට මාස පහක් ගතවන තුරු ඒ වස් විසූ විහාරයට ලැබෙන සියලු සිවුරු අයිතිය. එම අයිතිය ඉබේම මාස පහ ගතවීමෙන් ඉවත් වීම හෝ සංඝයා විසින් කර්ම වාක්‍යයකින් අතර මගදී ඉවත් කර දැමීම හෝ මෙහි පහත දක්වෙන එම කඨිනය ලැබූ භික්ෂුවගේ කටයුතු නිසා උන්වහන්සේගේම වරදින් ඉවත් වීම හෝ යන මේ කවර ක්‍රමයකින් වුවත් ඉවත්වීයාම කඨිනුද්ධාර නමින් හැඳින් වේ. ක්‍රම අටකින් මෙම අයිතිය අහෝසි වේ. කඨිනුද්ධරණය වීමට බලපාන එම කරුණු අටනම් පක්කමන්තිකා, නිට්ඨානන්තිකා, සන්නිට්ඨානන්තිකා, නාසනන්ති කා, සවණන්තිකා, ආසාවච්ඡේදිකා, මාතික්කන්තිකා, සහුබ්භාරා නම් වේ. මේ කඨිනුද්ධාර ක්‍රම අට නොයෙක් ආකාරයෙන් වර්ග කොට ඡේද වෙන් කොට පෙළෙහි දක්වා ඇත.[94] මෙම කරුණු මෙතරම් දුරට වර්ග කර දක්වා ඇත්තේ ප්‍රතිපත්ති ගරුක නොවූ ඇතැම් භික්ෂූන් යම් කිසි සිදුරකින් රිංගා විනය ශික්ෂාවන්ට විරුද්ධව ක්‍රියා කිරීම වළක්වනු පිණිසය. කඨිනය පිළිබඳ පළිබෝධ කරුණු දෙකක් ද පළිබෝධ නොවන කරුණු දෙකක් ද පෙන්වා දී ඇත.[95]

ඉහත දක්වූයේ කඨින චීවර පූජාවේ ඓතිහාසික පසුබිම කෙසේ සකස් වූයේ ද යන්න පිළිබඳවය. ඒ අනුව විමසා බැලූ කළ පෙනීයන වැදගත්ම කාරණය වන්නේ වස් විසීමේ ශික්ෂාව පනවන්නට සමාජ මතය ප්‍රබල හේතුවක් වූ බවයි. බුදුරජාණන් වහන්සේ ස්වකීය ශ්‍රාවකයන්ට වස්සූපනායික වත පනවන්නට පදනම් වූයේ ද ජෛන බැතිමතුන්ගේ විවේචනාත්මක අදහසක් බව සඳහන් කරයි.[96] එනමුදු බුද්ධත්වයෙන් විසි වසක් ගතවන තුරු ශික්ෂාවන් පනවා නොතිබුණු අතර ඒ තාක් සමාජයෙහි මේ පිළිබඳ යම් මතවාදයක් පළ නොවීම ද පුදුමයට කරුණකි. ඒ කෙසේ වුව ද පොදු සමාජ මතයට අනුකූල වීමක් වශයෙන් වස් ශික්ෂාපද පනවා ඇති බව පෙනේ. ඇතැම් භික්ෂූන්ගේ වැරදි හැසිරීම් **රටා** නිසා පැනවූ ශික්ෂාපද තවත් අනු ප්‍රඥප්ති පනවමින් එය විධිමත් කර ඇත. වස් වසන්නේ කවර දිනයක ද, වස් විසීමෙන් පසු කිනම් අයුරකින් කටයුතු කළ යුතු ද, වස්විසිය යුත්තේ කුමන ස්ථාන වල ද, වස් නොවිසිය යුතු තැන් මොනවාද, යනාදි විවිධ වූ කාරණා පිළිබඳව පැහැදිළි අවබෝධයක් ලබා දී ඇත.

වස් තුන් මස සංචාරක දිවියෙන් තොරව ගත කළ යුතු වුව ද යම් යම් සාධාරණ හේතු කාරණා කිහිපයක් පෙන්වා දෙමින් එබඳු අවස්ථා වල දී සත්තාහකරණයෙන් යන්නට ද අවස්ථාව ලැබී ඇති බව පෙනේ. වස් විසීම භික්ෂූන්ට අලුත් දෙයක් වූ අතර ඇතැම් භික්ෂු පිරිස් ඒ කාලය තුළ සියලු දෙනාගේ සමගිය ආරක්ෂා කර ගැනීමට නම් ඔවුනොවුන් හා කථා නොකර සිටිමු යැයි ඇති කරගත් කතිකාවකින් යුතුව කටයුතු කිරීම නිසා පවාරණය කිරීමට අනුදැන වදාරා ඇත. මෙමගින් අපේක්ෂා කර ඇත්තේ වස් තුන් මස ගත කළ භික්ෂූන් අතර හිත් අමනාපකම් ඇති නොවන අයුරින් ඔවුන්ගේ සමගිය තවදුරටත් ඉදිරියට පවත්වා ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමයි. සමාජය තුළින් ඇති වූ බලපෑම් හා විවිධ භික්ෂූන්ගේ හැසිරීම් ආදිය මුල් කරගෙන පැන නැගුණු ඇතැම් ගැටළුකාරී අවස්ථාවන් මගහරවා ගන්නට අවශ්‍ය ප්‍රඥප්ති පනවමින් පවාරණ කර්මය ද විධිමත් කර ඇත. වස්

තුන්මස ගත කළ භික්ෂූන් වෙන්ව යාමේ දී ඇසීමෙන් දැකීමෙන් සැක කිරීමෙන් ආදී කුමන අයුරකින් හෝ යම් වැරැද්දක් දුටුවේ නම් ඒ බව දන්වා එම වරද නිවැරදි කර ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කර දීම මෙම පවාරණ කර්මය තුළින් මූලික වශයෙන් අපේක්ෂා කර ඇති බව පෙනේ. හිත් අමනාපකම් වලින් තොරව ඉන් බැහැර වීමේ ඉඩකඩ මෙමගින් උදා කර දී ඇති බව පෙනේ.

---

[1] ම.ව.පා. 1, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1957,42 පිට

[2] එම, 346 පිට

[3] එම, 346 පිට

[4] එම, 346 පිට

[5] එම, 346 පිට

[6] එම, 348 පිට

[7] එම, 348 පිට

[8] එම, 348 පිට

[9] එම, 348 පිට

[10] එම, 350 පිට

[11] එම, 350 පිට

[12] එම, 350 පිට

[13] එම, 350 පිට

[14] එම, 353-357 පිටු

[15] එම, 358 පිට

[16] එම, 358 පිට

[17] එම, 358 පිට

[18] එම, 358 පිට

[19] එම, 358-367 පිටු

[20] එම, 360-366 පිටු

[21] එම, 368-371 පිටු

[22] එම, 370 පිට

[23] එම, 370 පිට

[24] එම, 372 පිට

[25] එම, 372-373 පිටු

[26] එම, 372 පිට

[27] එම, 372 පිට

[28] එම, 372-373 පිට

[29] එම, 372 පිට

[30] එම, 374 පිට

[31] එම, 374 පිට

[32] එම, 374 පිට

[33] එම, 376 පිට

[34] එම, 374 පිට

[35] එම, 374 පිට

[36] එම, 376 පිට

[37] එම, 376 පිට

[38] එම, 376 පිට

[39] එම, 376-379 පිටු

[40]එම, 380 -383පිට

[41] විමල බුද්ධි හිමි, වටගෙදර, කඨින චීවර පූජාව අනෝතත්ත විල හා කථානානිසංස වර්ණනාව, නැදිමාල, 2006, 24 පිට

[42] විමල බුද්ධි හිමි, වටගෙදර, කඨින චීවර පූජාව අනෝතත්ත විල හා කථානානිසංස වර්ණනාව, නැදිමාල, 2006, 24 පිට

[43] ම.ව.පා. 1, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1957,382 පිට

[44] ම.ව.පා. 1, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1957,382 පිට

[45] එම 382-385 පිටු

[46] මෙත්තානන්ද හිමි, තලල්ලේ, එදිරිසිංහ, දයා, කඨින පින්කම හා ප්‍රාතිමෝක්ෂය, පානදුර, 2004, 18 පිට.

[47] චන්දවිමල හිමි, රේරුකානේ, විනය කර්ම පොත, අනුල මුද්‍රණාලය, 1956, 93 පිට.

[48] එම, 93 පිට

[49] මෙත්තානන්ද හිමි, තලල්ලේ, එදිරිසිංහ, දයා, කඨින පින්කම හා ප්‍රාතිමෝක්ෂය, පානදුර, 2004, 18 පිට.

[50] ම.ව.පා. 1, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1957, 394 පිට

[51] එම. 400 පිට.

[52] ම.ව.පා. 1, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1957,401 පිට

[53] එම. 401 පිට.

[54] එම. 403 පිට.

[55] එම. 403 පිට.

[56] එම. 419-423 පිටු.

[57] එම. 425 පිට.

[58] එම. 427 පිට.

[59] එම. 429 පිට.

[60] එම. 431-435 පිටු.

[61] එම. 449 පිට.

[62] එම. 449 පිට.

[63] එම. 449 පිට.

[64] එම. 449 පිට.

[65] එම. 451 පිට.

[66] එම. 451 පිට.

[67] එම. 451 පිට.

[68] එම. 451 පිට.

[69] එම. 453 පිට.

[70] එම. 467 පිට.

[71] චන්දවිමල හිමි, රේරුකානේ, විනය කර්ම පොත, අනුල මුද්‍රණාලය, 1956, 97 පිට.

[72] එම. 97 පිට.

[73] එම. 107 පිට.

[74] ම.ව.පා. 1, පවාරණඛන්ධකය, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1957,629 පිට

[75] පුරාණ කඨිනානිසංස තුනක්, (සංස්), පඤ්ඤාලෝක හිමි, මීගොඩ, මහරගම,1997,56 පිට.

[76] ම.ව.පා. 2, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1957,631 පිට

[77] එම. 633 පිට.

[78] පරිවාර පාළි 2, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1957, 171-173 පිටු

[79] පුරාණ කඨිනානිසංස තුනක්, (සංස්), පඤ්ඤාලෝක හිමි, මීගොඩ, මහරගම,1997,08 පිට.

[80] කඨින විනිච්ඡය, (සංස්) පඤ්ඤාලෝක හිමි, නැදිමාල, 1997, 11 පිට.

[81] ශ්‍රී පඤ්ඤාසාර හිමි, කිරිවත්තුඩුවේ, කඨින වංශය, පෑලියගොඩ, 1950, 67 පිට.

[82] මෙත්තානන්ද හිමි, තලල්ලේ, එදිරිසිංහ, දයා, කඨින පින්කම හා ප්‍රාතිමෝක්ෂය, පානදුර, 2004, 29 පිට.

[83] චන්දවිමල හිමි, රේරුකානේ, විනය කර්ම පොත, අනුල මුද්‍රණාලය, 1956, 107 පිට.

[84] පරිවාර පාළි 2, කඨින භේද, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1957, 179 පිට

[85] එම, 179 පිට.

[86] එම, 181 පිට.

[87] චන්දවිමල හිමි, රේරුකානේ, විනය කර්ම පොත, අනුල මුද්‍රණාලය, 1956, 114 පිට

[88] ශ්‍රී පඤ්ඤාසාර හිමි, කිරිවත්තුඩුවේ, කඨින වංශය, පෑලියගොඩ, 1950, 75 පිට.

[89] පුරාණ කඨිනානිසංස තුනක්, (සංස්), පඤ්ඤාලෝක හිමි, මීගොඩ, මහරගම,1997, 85-90 පිටු.

[90] එම, 88 පිට.

[91] ම.ව.පා. 2, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1957, 629 පිට

[92] පුරාණ කඨිනානිසංස තුනක්, (සංස්), පඤ්ඤාලෝක හිමි, මීගොඩ, මහරගම,1997, 135පිට.

[93] ම.ව.පා. 2, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1957, 628 පිට

[94] ම.ව.පා. 2, බු.ජ.ත්‍රි.ග්‍ර.මා., 1957, 632-665පිටු

[95] එම, 667පිට.

[96] විමලධම්ම හිමි, කන්දේගොඩ, භාරතීය හා බටහිර දර්ශනය මඟින් පිළිබිඹු වන මිනිසා පිළිබඳ සංකල්පය, කර්තෘ ප්‍රකාශනයකි, ජයදේව ප්‍රින්ටර්ස්, කොළඹ 08, 2002, 123 පිට.